16

විම/1/3 2005.11.03

භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 01/2004(2)

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.
ලේකම්,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
සියළුම ප්‍රධාන ලේකම්වරුන් වෙත.

<u>ගුරු වැටුප් ගෙවීම - 2005 නොවැම්බර් මාසය</u>

මගේ සමාංක හා 2004 නොවැම්බර් මස 05 වන දින නිකුත් කරන ලද මෙම දෙපාර්තමේන්තුවේ අංක 01/2004 දරණ චක්‍රලේඛය හා බැඳේ.

2. 2005 ජනාධිපතිවරණය 2005.11.17 වන දිනට යෙදී ඇති බැවින් ද, 2005.11.12 හා 13 යන දිනයන් සෙනසුරාදා හා ඉරිදා දිනයන් වූ බැවින් ද හා 2005.11.15 දිනය ද රජයේ නිවාඩු දිනයක් වන නිසාත්, 2005 නොවැම්බර් මස ගුරු වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය අක්මුදල් 2005.11.11 දිනට නිදහස් කිරීමට ම විසින් කටයුතු සූදානම් කර ඇත.

3. එබැවින් මැතිවරණ රාජකාරී කටයුතු වල නිරත නිලධාරීන්ට අපහසුතාවයක් සිදු නොවන ආකාරයට නොවැම්බර් මස ගුරු වැටුප් ගෙවීම සඳහා සුදුසු දිනයක් නිශ්චය කර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි. තවද මේ බව ඔබ යටතේ ඇති සියළුම ආයතනයන් වෙත දැනුම් දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලා සිටිමි.

ලලිත් ආර්. ද සිල්වා
අධ්‍යක්ෂ ජනරාල්,
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

o/c

පිටපත් :- 1. විගණකාධිපති - දැ.ගැ.ස.
2. මැතිවරණ කොමසාරිස් - "